# ආදි බෞද්ධ දර්ශනයේ ඥානවිභාගීය ඉගැන්වීම කිසියම් ලෝක දෘෂ්ටික පදනමක් මත කේන්ද්‍ර ගත වූවක් ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එස්. ඒ. එස්. චතුරිකා**[1]

**හැඳින්වීම**

ලොව ඕනෑම දර්ශනවාදයක අනන්‍යතාව එහි ඥානවිභාගීය පදනම සමඟ සැසඳේ. එම නිසා ඕනෑම දාර්ශනික පද්ධතියක ඥානවිභාගාත්මක පදනමක් පවතින බව ගම්‍යමාන වේ. සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ ශාස්තෘත්වයෙන් පිබිදෙන බෞද්ධ දර්ශනය පෙරදිග දාර්ශනික පද්ධතිවලට පමණක් නොව අපරදිග සියලු දාර්ශනික පද්ධතීන්ට පවා බලපෑම් සහගත දාර්ශනික පද්ධතියක් බවට පත්වූයේ එහි ඥානවිභාගාත්මක පදනම නිසා ය.

නූතන බටහිර දර්ශනයේ ඥාන විභාගාත්මක පදනම්වාදය සහ පශ්චාත් ව්‍යුහවාදී සම්ප්‍රදායන් හි ඥාන විභාගාත්මක පදනම මෑත කාලීන ඇතැම් උගතුන් විසින් අධිපති ධාරාවේ මතවාදයන් ලෙස සලකා විවේචනයට ලක් කරන ලදී. නමුත් පෙරදිග ආදි බෞද්ධ දර්ශනය පදනම් වන ඥානවිභාගාත්මක පදනම යම් සුවිශේෂී මුහුණුවරක් උසුලන බව පැහැදිලි විය. යම් පදනමක් මත දැනුම ගොඩනගා, එම ගොඩනැගූ ඥානයෙන් ම ඥානය ගොඩනගමින් මූලය හෙවත් පදනම වියුක්ත කිරීම එහි සුවිශේෂීත්වය විය.

**පර්යේෂණ ගැටලුව**

ආදි බෞද්ධ දර්ශනයේ ඥානවිභාගවාදය හුදෙක් භෞතිකවාදී හා විඥ්ඥාණවාදී, බහුත්වවාදී හා ඒකත්වවාදී පෙරඅපර චින්තනයන්ගෙන් වියුක්ත වූවකි. එය සත්ත්වයාගේ පැවැත්ම ම දුක්ඛිතය යන පදනම මත පිහිටයි. පැවැත්මේ පවත්නා දුකක් පිළිබද අදහසක් මුල් බුදුසමය නොදරයි. ආදි බෞද්ධ දර්ශනයේ මූලික අභිප්‍රාය වන්නේ මෙම පැවැත්මත් සමඟ උද්ගත වන ප්‍රධාන ගැටලු කිහිපයක් වන ජාති, ජරා, ව්‍යාධි, මරණයන්ට එරෙහිව ඥානවිභාගාත්මක ප්‍රවේශයකින් විසඳුමක් පෙන්වා දීමයි.

ජාති, ජරා, ව්‍යාධි, මරණ පැවැත්මේ දුකක් වශයෙන් සලකන්නේ නම් එය සාවද්‍ය වන්නේ මුල් බුදු සමයේ පැවැත්ම ම දුකක් ලෙස සලකන බැවිනි. නමුත් හුදු දර්ශන ඉතිහාසයන් දෙස බැලීමෙන් ප්‍රකට වන්නේ පැවැත්ම පිළිබඳ කරන ලද සාකච්ඡා ප්‍රධාන වශයෙන් භෞතිකවාදී සහ විඥ්ඥාණවාදී පදනම්වලින් වටහා ගැනීමට බොහෝ පිරිස් දරනා ලද උත්සාහයයි. එමෙන් ම පැවැත්ම පිළිබඳ වටහා ගැනීම ඇතැම් බුද්ධිවාදී සහ ඒකත්වවාදී චින්තකයෝ ඒ ඒ රාමුව ඔස්සේ වටහා ගැනීමට ද, උත්සාහ දරා

1. නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය, බෞද්ධ අධ්‍යයන පීඨය, විශේෂවේදී සිව්වන වසර
sujanichathurika226@gmail.com

ඇත. භෞතිකවාදී මෙන් ම විඤ්ඤාණවාදී මත දාරිහු ද ස්වකීය දෘෂ්ටි න්‍යෂ්ටිය මත පිහිටා පැවැත්ම පිළිබඳ ව වටහා ගැනීමට උත්සාහ දරා ඇත. එම නිසා ආදි බෞද්ධ දර්ශනයේ මූලික අභිප්‍රාය වූයේ සත්ත්වයාගේ ප්‍රවාහී පැවැත්ම නිශේධනය කළ හැකි ඥාන මාර්ගයක් බිහි කිරීමයි. එය හුදු ලෝක දෘෂ්ටියක පදනමක් මත කේන්ද්‍ර ගත වූවක් ද යන්න විමර්ශනයට ලක් කිරීම මෙහි ප්‍රධාන අධ්‍යයන ගැටලුවයි.

**පර්යේෂණ අරමුණු**

ආදි බෞද්ධ දර්ශනයේ ඥානවිභාගවාදය කිසියම් ලෝක දෘෂ්ටික පදනමක් මත කේන්ද්‍රගතවූවක් ද යන්න පිළිබඳ නිරවද්‍ය අදහසක් ලබා ගැනීම මෙහි මූලික පර්යේෂණ අරමුණයි.

**ආත්මවාදී දර්ශනයන්ට පිළිවදන් සැපයීම**

ඥානවිභාගාත්මක ක්‍රියාවලිය සහ පරමාර්ථය පිළිබඳ පවත්නා සාවද්‍ය මත ඛණ්ඩනය කිරීම.

**පර්යේෂණයේ සීමා**

ආදි බෞද්ධ දර්ශනයේ ඥානවිභාගවාදය පිළිබඳ ඉගැන්වීම මෙහි ප්‍රධාන පර්යේෂණ සීමාවයි. පශ්චාත් නූතනවාදී දර්ශනයන් පිළිබඳ ගැඹුරු අවදානයක් යොමු නොකිරීමත් ආදි බෞද්ධ දාර්ශනික ඉස්මතු කිරීම් විවරණය කරමින් හා ඒ මත සීමා වෙමින් ඥානවිභාගවාදයේ ලෝක දෘෂ්ටික පදනම යථාර්ථවත් ද අයථාර්තවත් ද යන්න මෙහි දී අධ්‍යයනය කෙරේ.

**පර්යේෂණයේ වැදගත්කම**

දෘෂ්ටි ග්‍රහණය විචාර බුද්ධි සහිත වූ පුද්ගලයාට පවා ස්වාභාවික වූවකි. යථා තත්වය අවබෝධ කර ගැනීම අරමුණු කොට ගත් ප්‍රතිපදාවෙහි ලා ප්‍රාථමික වශයෙන් සමහර දෘෂ්ටි හිතකර වේ. සමහර දෘෂ්ටි අහිතකර වේ. ආර්ය මාර්ගයට පිළිපන් පුද්ගලයාගේ අධ්‍යාත්ම දියුණුවට හිතකර වූ දෘෂ්ටි සම්‍යක් දෘෂ්ටි වශයෙන් හඳුන්වනු ලැබේ. ඊට අහිතකර වූ දෘෂ්ටි මිත්‍යා දෘෂ්ටි වශයෙන් හඳුන්වනු ලැබේ. එහෙත් මේ දෙපක්ෂය ම දෘෂ්ටි විෂයෙහි ලා සංග්‍රහ කරනු ලැබේ. බුද්ධ දේශනාව වූයේ සර්වදෘෂ්ටි ප්‍රහාණයයි. එනම් මිථ්‍යා දෘෂ්ටිය පමණක් නොව සම්‍යක්දෘෂ්ටිය ද මෙකී ප්‍රහාණයට ඇතුළත් වන බව යි. දෘෂ්ටි ග්‍රහණය නිසා නිරායාසයෙන් පක්ෂග්‍රහණය සිදු වේ. මහා චත්තාරිසක සූත්‍රයේ ආර්යමාර්ගයේ ගමන් කරන පුද්ගලයාට අනුපූර්ව ශික්ෂාව අනුව දෘෂ්ටි ප්‍රහාණය සාදා ගත හැකි බව පැහැදිලිව සඳහන් වේ.

සියලු දෘෂ්ටි ප්‍රහානය කළ විට පිරිසිදු ගැඹුරු ඥාන දර්ශන පහළ වේ. දෘෂ්ටි ග්‍රහණයත්, දෘෂ්ටි උපදානයත් ඉන්ද්‍රිය බද්ධව සිදුවන නමුත් ධර්මයේ සඳහන් වන දර්ශනය අතීන්ද්‍රිය වශයෙන් නිකෙලෙස් සිතෙහි පහළවන්නකි. විමුක්තිකාමී පුද්ගලයා විසින් කළ යුත්තේ දෘෂ්ටි පටලයෙන් මිදී දර්ශන සම්පත්තීන් සිය සන්තානයේ පහළ කර ගැනීමයි. එම නිසා බුදුසමය විඥානවාදී යැයි චෝදනා කරන සියල්ලෝ ම බුදුසමයේ ඥානවිභාගාත්මක ක්‍රියාවලිය පිළිබඳ හෝ පරමාර්ථ පිළිබඳ ව පවත්නා දුර්වල

අවබෝධය නිසා ලෝක දෘෂ්ටීන්ට නතුවෙයි. සාමාන්‍ය ඥානවිභාගාත්මක මාර්ගය ඉන්ද්‍රිය අනුභූතියයි. අනුභූතික සිදුවීම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය මත ජරා මරණ ඇතිවීම ඉපදීම හේතු කොට සිදුවන බව ගම්‍ය වේ. මෙය ලෝක දෘෂ්ටික පදනමකින් ගෙන පැවැත්මේ පැන නඟින ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමු කරයි.

ආදි බෞද්ධ දර්ශනයට අනුව පැවැත්ම ම ගැටලුවකි. පුද්ගලයෙකුට ඇසෙන්, කනෙන්, නාසයෙන්, දිවෙන්, කයෙන් හා මනසින් ඥානයන් ලබා ගත හැකි ය. අන් කිසිවකින් ඥානයන් ලබා ගත නොහැකි ය. ලෝකය යැයි පුද්ගලයා සිතා ගත් යමක් පවතී නම් ඒ සියල්ල මෙම ආයතන හරහා ලබා ගන්නා අද්දැකීම් මාත්‍රයන් නිසා සකස් වන මනෝමය තත්වයකි. නමුත් මෙම ඉන්ද්‍රියන්ට අරමුණු නොලැබේ නම් පැවැත්ම පිළිබඳ කිසිදු සංකල්පයක් ඇති නො වේ.


**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක ක්‍රමවේදය, ප්‍රාථමික මූලාශ්‍රය භාවිතය, ද්වීතියික මූලාශ්‍රය භාවිතය

**සමකාලීන ලේඛන පිළිබඳ අධ්‍යයනය**

**ප්‍රතිඵල**

යමක බාහිර පැවැත්මක් ඇතැයි යමෙක් පවසයි නම් එහි ඇත්තේ ද ෂඩායතන ක්‍රියාකාරීත්වය ම පමණි. පැවැත්ම බිහි වන්නේ ද පුද්ගලයා ඉන්ද්‍රියාරම්මණ ග්‍රහණය කරන විටය. එවිට ග්‍රහණය කරන්නෙක් පිළිබඳ සංකල්පය ඇති වේ. ඒ නිසා මුල් බුදු සමය ලෝකය කියන්නෙත්, සෙසු ප්‍රජාව පැවැත්ම කියන්නෙත් මේ ග්‍රහණය කරගැනීමේ ක්‍රියාවලියෙන් මැවෙන පුද්ගල සත්තාවටය. මුල් බුදුසමයට අනුව ඍජුව ම දක්වතොත් විඤ්ඤාණය-නාමරූප හා නාමරූප-විඤ්ඤාණය යන ඥාන්‍යවිභාගීය ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස පැවැත්ම ජනිත වේ. මුල් බුදුසමයට අනුව විඤ්ඤාණය හෙවත් දැකීම තනිව සකස් නො වේ. එය මනස නැමැති ඉන්ද්‍රිය ධර්මයේ ප්‍රධානත්වයෙන් ෂඩායතන ක්‍රියාවලිය හරහා සිදු වේ. එනම් මෙම රූපයන්ට නාමධර්ම නොමැති ව සම්භවය වීමට ක්‍රමයක් නොමැති බව යි. අනෙක් අන්තයෙන් ගත් විට නාම ධර්මයන්ට ද රූප නොමැතිව සම්භවය වීමට ක්‍රමයක් නොමැති බව ගම්‍ය වේ. මේ දෙකට ම විඤ්ඤාණය නොමැති ව සමුදය වීමට ද ක්‍රමයක් නොමැති බව පැහැදිලි ය.



ඒ මන්ද යත් සළායතනික නිමිති පිළිඹිබු කරන්නේ විඤ්ඤාණය වීම හේතුවෙනි. පුහුදුන් මනස එකී ඉන්ද්‍රියාරම්මණ විකෘති ස්වරූපයෙන් හඳුනා ගනියි. එවිට එය ලෝක දෘෂ්ටියක් ලෙස දෘෂ්ටි පථයකට ලඝු කරයි. නමුත් පැවැත්ම වනාහි, ඉන්ද්‍රිය අද්දැකීම් ලෝකයට සාපේක්ෂ සත්තාවකි. එනම් මේ මොහොත තුළ විඤ්ඤාණය-නාමරූප ප්‍රත්‍යුප්පන්න වීමයි. ප්‍රත්‍ය ඇති කල්හි සමුදය වීමයි. ඒ නිසා මුල් සමයාගත ඥානවිභාගවාදය යම් ලෞකික දෘෂ්ටි පථයකට කේන්ද්‍රගත වීමක් සිදු නොවේ. එය ප්‍රත්‍යුප්පන්න ඉන්ද්‍රියාරම්මණ අනුභූතියට අනුව මේ මොහොත තුළ සිදු වන්නකි. එමනිසා ආදි බෞද්ධ දර්ශනය තුළ මනසට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. විකල්පීය ඥානයක් ගොඩනගන්නේ නම් එය කළ හැක්කේ ඉන්ද්‍රීය හයෙහි අනුභූතිය ඇසුරෙන් බව වටහා ගත් විට ඊට ඇති එකම ප්‍රවේශය මනස, සිත හෙවත් විඤ්ඤාණය බව පිළිග ැනීමට සිදුවන්නේ උක්ත සඳහන් ඉන්ද්‍රීය අත්දැකීම් භුක්ති විඳින්නේ මනස වීම නිසා ය. මනස මූලික වී භවයට අදාළ වන පරිදි සංජානන මට්ටමින් එනම් වේගවත් ඉන්ද්‍රිය ක්‍රියාවලිය හරහා අද්දැකීම් ලබන විට ඇති වන්නේ ඒවා අද්දකින්නෙක් සහ අද්දැකීමට බාහිර ලෝකයේ දේවල් පවතිනවාය යන ඥානයයි. මේ ඥානය නිසා පුද්ගලයා අසත්‍ය සත්තාවක ඇලෙයි. පැවැත්මට කැමති වෙයි. එකී ලෝක දෘෂ්ටිය බැහැරලීම උදෙසා මුල් බුදුසමය නිශේධනීය ඥානවිභාගවාදය පෙන්වා දෙයි. එහි දී මනස මූලික කරගත් පැවැත්මට අදාළ මනසිකාර, යෝනිසෝ මනසිකාරය බවට පත් කර ගත යුතු ය. එවිට විඤ්ඤාණ බීජ රෝපණය වෙමින් පැවැත්මට ප්‍රත්‍ය සපයන බවත් එහි ඵල ලෙස නාමරූප ගොඩනැගෙන බවත් හඳුනාගත හැකි ය.

**නිගමනය**

නමුත් සාමාන්‍ය පුහුදුන් පුද්ගලයා සෑම දෙයක්ම පවත්නා ස්වභාවය අනුව ම හඳුනාගනියි. සියල්ල පිළිබඳ පවත්නා සැටියෙන් ම හඳුනාගෙන මුළා සහගත හැඟීම් ඇතිකර ගනී. සියල්ල තුළ මම ඇත, සියල්ල මම වෙමි යැයි සියල්ල ම අභිනන්දනය කරන බව මූල පරියාය සූත්‍රය තුළින් ද පෙන්වා දෙයි. එසේ සිදුවන්නේ පුද්ගලයා හට සියල්ල පිළිබඳ පිරිසිඳගත් අවබෝධයක් නොමැති නිසා ය. සංජානන ඥානයෙන් දෘෂ්ටි පැන නැඟි පසු පුද්ගලයා ඒ වටා කේන්ද්‍රාභිසාරී වෙමින් දෘෂ්ටීන් ගොඩනගයි. මෙය බැහැරලන දර්ශනයේ ඥානවිභාගවාදය සත්ත්වයාගේ ප්‍රවාහී පැවැත්ම නැතිකළ හැකි ඥාන මාර්ගයක් බිහි කිරීම හරහා පැවැත්ම සමඟ උද්ගත වන කේන්ද්‍රීය ගැටලුවලට විසඳුම් සෙවීම සිදු කරන ලදී. සිද්ධාර්ථයන් හට අනභිසම්බුද්ධ අවස්ථාවන්හි සිතට නැඟි මෙකී ගැටලු ඥානවිභාගවාදය ඔස්සේ විග්‍රහාත්මකව පෙන්වා දෙන අතර එය යථාර්ථීය දැක්මකි, පෙන්වා දීමකි. මෙකී පෙන්වාදීම් ඔස්සේ නිගමනය කළහැකි වන්නේ ආදි බෞද්ධ දර්ශනයේ ඥානවිභාගවාදය කිසියම් ලෝක දෘෂ්ටියක පදනමක් මත කේන්ද්‍රගත වූවක් නොවන බව යි.

**මුඛ්‍ය පදඃ** අභිජනනය, ඉන්ද්‍රියාරම්මණ, ප්‍රත්‍යුප්පන්න, ඥානවිභාගවාදය, සංජානනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තර නිකාය 6*, මූලක සූත්‍රය, (2015) බුද්ධ ජයන්ති ත්‍රිපිටකය, නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ඛුද්දක නිකාය 1*, ලෝකාවෝලෝකන සූත්‍රය, (2015) බුද්ධ ජයන්ති ත්‍රිපිටකය, නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ධම්මරතන හිමි, නාරාවිල, හැඬිපන්නල පඤ්ඤාලෝක හිමි, (1969). *භාරතීය දර්ශන*. කොළඹ 11ඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ඥානවිමල හිමි කැප්පෙටිපොල. (2023) 'ආදි බෞද්ධ දර්ශනයේ ඥානවිභාගීය නිශේධනය'. සුමේධ හිමි, තල්ගහවෙල, (සංස්ඃ), *රතන ප්‍රභා ශාස්ත්‍රීය සඟරාව.* දංකොටුවඃ වාසනා පොත් ප්‍රකාශකයෝ.